# 多言語情報コーナー （令和７年　１月号）

## 1. 2025 වන වසර සඳහා නාගරික බදු සහ ප්‍රාන්ත බද්ද ඉදිරිපත් කිරීම පිලිබඳව

2025 ජනවාරි මස පළමුවන දිනට තොචිගි නගරයේ ලිපිනයක් ඇති සහ එක් වැටුපක් හෝ ලබා ඇති විදේශීය පුරවැසි භාවය ඇති අය විසින්ද ගෙවිය යුතු බදු ගෙවීමක් වේ.නාගරික බද්ද සහ ප්‍රාන්ත බද්ද යනු ඔබ ජීවත් වන නගරයට හෝ ප්‍රදේශයට ගෙවනු ලබන බදු ගෙවීමක් වන අතර මෙය ජුමින්සෙඉ ලෙසද හඳුන්වනු ලැබේ. මෙම නේවාසික බද්ද ගෙවනු ලබන්නේ එම ප්‍රදේශයේ ජීවත් වන පුද්ගලයින් විසින් බැවින් එම මුදල් එම කලාපයේම සමාජයේ විවිධ වියදම් වෙනුවෙන් යොදා ගනුලබන අතර එය අධ්‍යාපනය, සුභසාධනය සහ කසළ බැහැර කිරීම වැනි දෛනික ජීවිතයට සම්බන්ධ පොදු සේවාවන් සඳහා භාවිතා වේ.

ගෙවිය යුතු බදු මුදල තීරණය වන්නේ පෙර වසරේ ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා තමන් විසින් ලබාගන්නා ලද වැටුප අනුව වේ.යම්කිසි ආයතනයක සේවය කරන පුද්ගලයින් සඳහා, සමාගම කල්තියා ඔවුන්ගේ වැටුපෙන් මෙම නේවාසික බද්ද අඩු කරනු ලැබේ. මෙය බදු අඩුකිරීම ලෙස හඳුන්වන අතර විශේෂ එකතුවක් ලෙස නගර ශාලාවට වෙත ගෙවනු ලැබේ. මෙය සමාගමක සේවය කරන පුද්ගලයින් සඳහා වන සාමාන්‍ය රීතිය වන අතර, ඔවුන් තමන්ගේ නේවාසික බද්ද නගර ශාලාවට ගොස් ගෙවිය යුතු වන්නේ නැත. ඔබ කොපමණ නේවාසික බද්දක් ගෙවා ඇත්ද යන්න සෑම මසකම ඔබේ සමාගමෙන් ලැබෙන වැටුප් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

ඔබ විසින් සේවය කරන ආයතනය මගින් 2025 ජනවාරි 1 වන දිනට, එම ආයතනයේ සේවය කරන සියලු දෙනා කොපමණ මුදලක් එක් එක් සේවකයා විසින් කොපමණ මුදලක් වැටුප් වශයෙන් ගෙවා ඇත්ද යන ගෙවීම් සහතිකයක් 2025 ජනවාරි 31 දිනට ඉදිරිපත් කරනු ලැබේ .
කෙසේ වෙතත්, ඔවුන්ගේ සේවා ස්ථානයේ සිට "වැටුප් ගෙවීමේ වාර්තාවක්" තොචිගි නගර ශාලාවට ඉදිරිපත් නොකළ අයද බදු නැවත සමාලෝචනය කිරීමක් සිදුකල යුතුය.
බදු වාර්තාව නැවත සමාලෝචනය කිරීම සඳහා ඇති කාලය වන්නේ පෙබරවාරි 17 සිට මාර්තු 17 දක්වා වේ. මෙම බදු වාර්තා නැවත සකස් කිරීම සඳහා දිනයක් සහ වේලාවක් වෙන්කර ගතයුතු අතර ඒ සඳහා වෙන් කර ඇති අංකය ඇමතීමෙන් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.
අවසාන බදු ප්‍රතිලාභ සකස් කිරීම නගර ශාලාවේදී ඇති අදාල ස්ථානය තුලදී ද සිදුකරන නමුත් විදේශීය යැපෙන්නන් සහ ඥාතීන් සඳහා අඩු කිරීම් බදු ප්‍රතිලාභ වැනි අයදුම්පත් තොචිගි බදු කාර්යාලයේදී සිදුකරනු ලැබේ.

යම් හෙයකින් ඔබ විසින් ගෙවිය යුතු නේවාසික බද්ද ගෙවා නොමැති නම්, ඔබ ජපානයේ රැඳී සිටීම සඳහා කාලය දීර්ඝ කිරීම සඳහා අයදුම් කිරීමේදී ඒ සඳහා අවසරයක් නොලැබෙන බැවින් බදු ගෙවීම් පැහැර හැරීමෙන් වලකින්න.

**2. ලියාපදිංචි වීමේ ආධාර ක්‍රියාවලිය සහ "නව සිසුන් සඳහා පාසල් සැපයුම් ගාස්තු" ඇතුළත් වීමට පෙර ගෙවීම් පිලිබඳව**

2025 අප්‍රේල් මාසයේදී ප්‍රාථමික පාසලට හෝ කනිෂ්ඨ පාසලට ඇතුළත් වීමට නියමිත දරුවන් සිටින නිවසක නම් සහ ආර්ථික හේතු මත, ඔබ පාසලට ඇතුළත් වීමට පෙර පාසල් බෑග්, නිල ඇඳුම් ආදිය මිලදී ගැනීමට අපහසු නම් පාසලට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට අපහසු පුද්ගලයින් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. අලුතින් ඇතුළත් වූ ළමුන් සහ සිසුන් සඳහා පාසල් සැපයුම් සහ ගාස්තු ආදිය පාසලට ඇතුළත් වීමට පෙර මාර්තු මාසයේදී ලබාදෙනු ලැබේ.

සුදුසුකම් ලබන්නේ කවුරුන්ද සහ අයදුම් කළ යුතු ආකාරය යනාදිය පිළිබඳ විස්තර සඳහා කරුණාකර නගර සභා ප්‍රධාන ගොඩනැගිල්ලේ 4 වන මහලට පිවිසෙන්න. කරුණාකර අධ්‍යාපන කටයුතු සාමාන්‍ය අංශය 0282 -21- 2462 අමතන්න. අයදුම් කිරීමේ කාලය 2025 පෙබරවාරි 7 දක්වා වේ.

**3. යම් බයිතෝ යනු අපරාධයක් ලෙස සලකනු ලැබේ.**

යම් බයිතෝ යනු ඔබ නොහඳුනන සහ Instagram වැනි සමාජ මාධ්‍ය හරහා කෙටි කාලයක් තුළ ඉහළ ආදායමක් උපයා ගත හැකි රැකියාවක් ලෙස ඉතාමත් ආකර්ෂණශීලි වචන භාවිතා කරමින් පුද්ගලයින් යොදවාගන්නා රැකියාවක් ලෙස හඳුන්වනු ලැබේ.

ඔබ ඒ සඳහා අයදුම් කළහොත්, විවිධ අපරාද සඳහා ඔබව සම්බන්ධ කිරීම යෙදවීම සහ විවිධ සොරකම් කිරීමට යෙදවීම වැනි දෑ මගින් ඔබව අපරාධකරුවකු බවට පත්වීමේ අවදානමක් ඇත.

ඉහත සඳහන් වන ආකාරයේ යම් බයිතෝ රැකියාව සඳහා අයදුම් කිරීමේදී ඔබගේ පෞද්ගලික තොරතුරු ලබාගැනීමක් සිදුකරන අතර පසුව ඔබට මෙම රැකියාව නතරකිරීමට අවශ්‍ය වුවද, ඔබගේ පෞද්ගලික තොරතුරු ලබාගැනීමක් සිදුවී ඇති බැවින් එය නතර කිරීමට නොහැකිවීම වීම ඔබ පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා තෙක් මෙම රැකියාව කිරීමට සිදුවේ.

''ඉහළ වැටුප් ලබන අර්ධකාලීන රැකියා'', ''එම දිනයේම මුදල් ගෙවීම'', ''පහසු සහ ඉහළ වැටුප් ලබන රැකියා'' වැනි ආකර්ශනීය වචන යොදාගැනීම සිදුවන බැවින් ඒ සඳහා ඔබ රැවටීමට ලක්නොවිය යුතුය.
ඔබට පහසුවෙන් විශාල මුදලක් උපයා ගත හැකි අර්ධකාලීන රැකියාවක් නොමැත. යම් හෙයකින් මෙවැනි දෑ සම්බන්දයෙන් ඔබට සැකයක් ඇතිවන්නේ නම් හැකි ඉක්මනින් ඔබේ පවුලේ අය, මිතුරන් හෝ පොලිසිය අමතන්න. පොලිස් උපදේශන අංකය # 9110 වේ.

**4. ඔබේ රුධිරයේ ඇති සීනි මට්ටම ඉහළ බව ඔබට පැවසුවහොත් ...**

දියවැඩියා රෝගය යනු ශරීරය පුරා රුධිර වාහිනී සහ ස්නායු වලට හානි කරන "මුළු ශරීර පද්ධතිමය සම්බන්ද රෝගයකි". රෝගය වර්ධනය වන තුරු රෝග ලක්ෂණ නොමැති තරම්ය. එමනිසා, ඒ සඳහා ප්‍රතිකාර නොකළහොත්, එය ආඝාත හා හෘද රෝග වැනි බරපතල රෝගාබාධවලට හේතු විය හැක.

රෝගය ඇතිවීම වැලැක්වීම සහ සංකූලතා වැලැක්වීම සඳහා, වෛද්‍ය පරීක්ෂණයක් කර රුධිරයේ සීනි මට්ටම ඉහළ මට්ටමක පවතීදැයි පරීක්ෂා කිරීම වැදගත්ය මෙම තත්වයේ අඛණ්ඩ පැවැත්මක් තිබේද යන්න මුල් අවධියේදී සොයා ගැනීමට හැකි අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිකාර කිරීම සහ තමන් විසින් සිදුකල යුතු ක්‍රියාකාරකම් ආරම්භ කිරීම වැදගත් වේ. විශේෂයෙන් වැදගත් වන්නේ ඔබේ ආහාර පුරුදු වෙනස් කිරීම සහ ව්‍යායාම වැඩිදියුණු කිරීම වේ.

දියවැඩියාව වැළැක්වීම සහ ආරක්ෂාවීම සඳහා වසරකට වරක් සෞඛ්‍ය පරීක්ෂණයක් සිදු කිරීම වැදගත් වේ.